Gayan Dileepa Gayan Dileepa Gayan Dileepa Gayan Dileepa Gayan Dileepa Gayan Dileepa Gayan Dileepa
Gayan Dileepa Gayan Dileepa Gayan Dileepa Gayan Dileepa Gayan Dileepa Gayan Dileepa Gayan Dileepa

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු**

**ගිණුම්කරණය 1** | **33** | **S** | **1** | පැය දෙකයි

මුළු ලකුණු

විභාග අංකය ------------------------------

## උපදෙස්

- අංක 01 සිට 30 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුර අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමි වේ.
- විභාග අංකය ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.

1. ඕනෑම ව්‍යාපාරයක ගිණුම්කරණය මගින් දත්ත තොරතුරු බවට පරිවර්ථනය කර තීරණ ගන්නා පාර්ශවයන්ට තීරණ ගැණීමේ කාර්ය සඳහා ලබා දේ. මෙලෙස ගිණුම්කරණය මගින් ව්‍යාපාරයක් බලාපොරොත්තු වන්නේ,

   I. සියළුම ගනුදෙනු ගිණුම් පොත්වල වාර්ථා කිරීමයි.
   II. කළමණාකරණය සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමයි.
   III. ආයතනයේ ශුද්ධ ලාභය ගණනය කිරීමයි.
   IV. තොරතුරු භාවිතා කරන පාර්ශවයන්ට තීරණ ගැණීමට වැදගත් තොරතුරු ලබාදීමයි.
   V. ව්‍යාපාරයේ වංචා වලක්වා ගැණීම.

2. රජය විසින් භාණ්ඩ හා සේව මත **VAT** ප්‍රතිශතය 12% සිට 15% දක්වා වැඩිකිරීම නිසා ව්‍යාපාරයේ විකුණුම් අඩු වේ.මෙම බලපෑම ඇතිවූ පරිසර සාධකය වන්නේ,

   I. නෛතික පරිසරය
   II. ආර්ථික හා දේශපාලන පරිසරය
   III. තාක්ෂණික පරිසරය
   IV. සමාජ හා සංස්කෘතික පරිසරය
   V. ශිල්පීය හා වෘර්ථීය පරිසරය

3. ව්‍යාපාරයක ගිණුම්කරණයට බලපෑම් කරන භාහිර පරිසර සාධකයන් ඇතුලත් කාණ්ඩය වන්නේ,

   I. ආර්ථික හා දේශපාලන / තාක්ෂණික / ශිල්පීය හා වෘර්ථීය / තොරතුරු තාක්ෂණික
   II. ආර්ථික සංස්කෘතික / සමාජ සංස්කෘතික / තාක්ෂණික / ආර්ථික හා දේශපාලන
   III. සමාජ හා සංස්කෘතික / ආර්ථික හා දේශපාලන / ශිල්පීය හා වෘර්ථීය / තාක්ෂණික
   IV. තොරතුරු තාක්ෂණික / ක්‍රියාවලිය / පාලන පද්ධතිය / ආයතනික සංස්කෘතිය
   V. තාක්ෂණික / ශිල්පීය හා වෘර්ථීය / තොරතුරු තාක්ෂණික / ආයතනික සංස්කෘතිය

4. පහත ගිණුම්කරණ සමීකරණ අතුරින් කුමන සමීකරණ නිවැරදි වන්නේ ද ?.

   A. ශුද්ධ වත්කම් = හිමිකම්
   B. වත්කම් + වියදම් = හිමිකම් + ආදායම් + වගකීම්
   C. වත්කම් + ආදායම් = හිමිකම් + වියදම් + වගකීම්
   D. ශුද්ධ වත්කම් = මුළු වත්කම් - ජංගම නොවන වගකීම් - ජංගම වගකීම්

   I. A,B හා D පමණි.
   II. A,B හා C පමණි.
   III. B හා D පමණි.
   IV. B,C හා D පමණි.
   V. B පමණි.

5. ආයතනයක් මූල්‍ය ප්‍රකාශණවල මූලිකාංග මැණිම සඳහා යොදාගතහැකි පදනමක් නොවන්නේ කුමක් ද ?.

   I. පිරිවැය පදනම් කරගෙනය.
   II. සාධාරණ අගය පදනම් කරගෙනය.
   III. උපලබ්ධි අගය පදනම් කරගෙනය.
   IV. වර්තමාන අගය පදනම් කරගෙනය.
   V. ඉහත කිසිවක් නොවේ.

6. ව්‍යාපාරයක ශුද්ධ ලාභය ගණනය කිරීම සඳහා යොදාගතහැකි සමීකරණයනම්,

   I. ආරම්භක ශුද්ධ වත්කම් - අවසාන ශුද්ධ වත්කම් - අමතර ප්‍රාග්ධනය + ගැණිලි
   II. අවසාන වත්කම් - ආරම්භක වත්කම් - අමතර ප්‍රාග්ධනය + ගැණිලි
   III. අවසාන ශුද්ධ වත්කම් - ආරම්භක ශුද්ධ වත්කම් + අමතර ප්‍රාග්ධනය - ගැණිලි
   IV. අවසාන ශුද්ධ වත්කම් - ආරම්භක ශුද්ධ වත්කම් - අමතර ප්‍රාග්ධනය + ගැණිලි
   V. ඉහත කිසිවක් නිවැරදි නොවේ.

පහත තොරතුරු භාවිතා කරමින් ප්‍රශ්න අංක 6 සහ 9 සඳහා පිළිතුරු සපයන්න.

සිසිර විසින් ජානකට පිරිවැය රු. 800,000 ක් වූ සහ ලකුණුකල මිල රු. 1,000,000 වූ තොගයක් ලකුණුකල මිලට 10% වෙළඳ වට්ටමකට යටත්ව අලෙවි කරන ලදි. මෙම තොගයෙන් රු. 120,000 පිරිවැය වූ තොගයක් දෝශ පැවති නිසා ජානක විසින් සිසිරට ආපසු යවන ලදි. මුදල් ගෙවීමේදී මාසයක් ඇතුලත රු. 500,000 ශේෂයක් පියවීම නිසා 5% වට්ටමකට යටත්ව සිසිරට මුදල් ලැබුණි.

7. ඉහත ගනුදෙනු ජානකගේ ව්‍යාපාරයේ ගිණුම් පොත්වල වාර්ථා කිරීමට අදාල මුලික පොත් දක්වන්න.

   I. විකුණුම් ජර්නලය, ආපසු එවුම් ජර්නලය, ලැබීම් මුදල් ජර්නලය, පොදු ජර්නලය.
   II. ගැණුම් ජර්නලය, පොදු ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය, ආපසු එවුම් ජර්නලය
   III. විකුණුම් ජර්නලය, ආපසු යැවුම් ජර්නලය, ගෙවීම් මුදල් ජර්නලය, පොදු ජර්නලය.
   IV. ගැණුම් ජර්නලය, ආපසු යැවුම් ජර්නලය, ගෙවීම් මුදල් ජර්නලය, ගෙවීම් මුදල් ජර්නලය.
   V. පොදු ජර්නලය, ගැණුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය, පොදු ජර්නලය

8. මෙම ගනුදෙනු සිසිරගේ ව්‍යාපාරයේ ගිණුම් පොත්වල වාර්තා කිරිමට අදාල මූලාශ්‍ර ලේඛණ පිළිවලින් දැක්වෙනුයේ.

   I. ඉන්වොයිසිය, හරපත, ලදුපත
   II. ඉන්වොයිසිය, බැරපත, ලදුපත
   III. ජර්නල් වවුචරය, හරපත, ලදුපත
   IV. ජර්නල් වවුචරය, හරපත, පිළිපත
   V. ඉහත කිසිවක් නොවේ.

9. ඉහත ගනුදෙනුව ජානකගේ ව්‍යාපාරයේ සහ සිසිරගේ ව්‍යාපාරයේ වෙළඳ වට්ටම් අඩුකලපසු අගය වාර්ථා කිරීමට මග පෙන්වන නිවැරදි ගිණුම්කරන සංකල්පය දක්වන්න.

I. ගිණුම්කරන ඒකක සංකල්පය.
II. මූල්‍ය මිණුම් සංකල්පය.
III. ඓතිහාසික පිරිවැය සංකල්පය.
IV. අඛණ්ඩ පැවැතිම පිළිබඳ සංකල්පය.
V. ද්විත්ව රූප සංකල්පය.

10. ඉහත ගනුදෙනුව සිසිරගේ ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණයට ගැලපීමෙන් පසු නිවැරදි සමීකරණය ඇතුලත් වන්නේ,

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| I. | + 60 000 | = | + 60 000 | | - |
| II. | + 175 000 | = | + 175 000 | | - |
| III. | + 85 000 | = | + 85 000 | | - |
| IV. | + 40 000 | = | + 40 000 | | - |
| V. | + 205 000 | = | + 180 000 | | + 25 000 - |

11. ආයතනයක් ගිණුම් තැබීමේ දී යොදාගන්නා මූලික ගිණුම්කරණ උපකල්පව වන්නේ,

I. මූල්‍ය මිණුම් සංකල්පය, ඒකක සංකල්පය
II. අදාල බව, විශ්වාසනියත්වය.
III. ආදායම් , වියදම්
IV. උපචිත සංකල්පය, අඛණ්ඩ පැවැත්ම
V. මූල්‍ය ගිණුම්කරණය, කළමණාකරන ගිණුම්කරණය

12. ආයතනය විසින් පිරිවැය රු. 1,000,000 ක් රථවාහනයක් 2017.07.01 දින මිලදී ගන්නා ලදි. රථ වාර්ශිකව 10% ක් පිරිවැය මත ක්ෂය කරනු ලබයි. ගිණුම් වර්ෂය 2017.12.31 දිනෙන් අවසන් වේ. මෙම ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණය මගින් නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| I. | + 100 000 | = | + 100 000 | + | 1100 000 |
| II. | + 900 000 | = | + 100 000 | + | 1000 000 |
| III. | + 1000 000 | = | + 100 000 | + | 900 000 |
| IV. | + 900 000 | = | - | + | 900 000 |
| V. | + 900 000 | = | + 900 000 | | - |

13. ආයතනයක යම් ගනුදෙනුවක් මූලික ගිණුම්කරණ සමීකරණයට ගැලපුපසු පහත පරිදි දැක්විණි. මෙම ගනුදෙනුව නිවැරදිව විස්තරකර ඇති පිළිතුර වන්නේ,

| තොගය | + | ණයගැති | + | මුදල් | = | ණයහිමි | + | අනෙකුත් වගකීම් | + | ප්‍රාග්ධනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | - 100 000 | | | = | - 90 000 | | | | - 10 000 |

I. රු. 100 000 ක ණයගැති යෙකුගෙන් ලද මුදල රු. 90 000 ක් වූ අතර දුන් වට්ටම රු. 10 000 කි.
II. රු. 90 000 ක ණයහිමි ශේෂයක් පිවීමේදී රු. 10 000 ක වට්ටමක් ලැබීම.
III. ණයගැතියන්ගෙන් ලද මුදලින් රු. 10 000 ක් අයිතිකරු රැගෙනයෑම.
IV. රු. 100 000 ක ලැබිය යුතු ණයගැති ශේෂයක් රු. 90 000 ක ණයිහිමි ශේෂයක් සමග හිලවුකල අතර මුදල් ලැබීමේ දී දුන් වට්ටම රු. 10 000කි.
V. ඉහත කිසිවක් නොවේ.

14. 2017.01.01 දින ආරම්භ කරන ලද අමිලගේ ව්‍යාපාරයේ පහත තොරතුරු යොදාගනිමින් 2017.12.31 දිනෙන් අවසන් පළමු මෙහෙයුම් වර්ෂයේ ශුද්ධ ලාභය ගණනය කරන්න.

2017.12.31 දිනට වත්කම් 2450 000
2017.12.31 දිනට වගකීම් 520 000

තවද,
- අයිතිකරු විසින් රු. 310 000 ක් වටිනා ණයහිමි ශේෂයක් තම පුද්ගලික මුදලින් පියවා ඇත.
- අයිතිකරු විසින් පුද්ගලික භාවිතය සඳහා රු. 30 000 ක් මුදලින් රැගෙනගොස් ඇති අතර ඔහුගේ බිරිඳ විසින් රු. 50 000 ක ගෘහභාණ්ඩ රැගෙන ගොස් ඇත.

I. රු. 1 930 000 කි.
II. රු. 1 650 000 කි.
III. රු. 2 450 000 කි.
IV. රු. 1 700 000 කි.
V. රු. 2 160 000 කි.

15. ගිණුම්කරණ මූලිකාංගයක් නොවන්නේ මින් කවරක් ද ?.

I. ආදායම්
II. වියදම්
III. වගකීම්
IV. මුදල් ප්‍රවාහයන්.
V. ඉහත කිසිවක් නොවේ.

16. පහත ගනුදෙනු එරංගගේ ව්‍යාපාරයේ 2017 දෙසැම්බර් මාසයට අදාලව සිදුවූ ගනුදෙනු වේ.

- පිරිවැය රු. 800 000 ක් වූ තොගයක් රු. 940 000 ක මිලකට අයිතිකරු විසින් පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රැගෙනයෑම.
- ව්‍යාපාරයේ රු. 650 000 ක ණයහිමි ශේෂයක් පියවීමට අයිතකරු විසින් 10% ක වට්ටමකට යටත්ව මුදල් ගෙවීම.

ඉහත ගනුදෙනු නිසාවෙන් අයිතිකරුගේ හිමිකමෙහි ඇතිවූ ශුද්ධ වෙනස සහ ආයතනයේ ලාභයට ඇතිවූ බලපෑම පිළිවලින් වන්නේ,

| | හිමිකමෙහි ඇතිවූ වෙනස | ලාභයට ඇතිවූ බලපෑම |
|---|---|---|
| I. | රු. 150 000 කින් අඩුවේ | රු. 205 000 කින් වැඩිවේ. |
| II. | රු. 1 450 000 කින් වැඩිවේ | රු. 65 000 කින් වැඩිවේ. |
| III. | රු. 1 385 000 කින් වැඩිවේ | රු. 140 000 කින් වැඩිවේ. |
| IV. | රු. 725 000 කින් වැඩිවේ | රු. 65 000 කින් වැඩිවේ. |
| V. | රු. 650 000 කින් වැඩිවේ | රු. 140 000 කින් වැඩිවේ. |

17. පාලගේ ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් වලට අදාල තොරතුරු කිහිපයක් පහත දැක් වේ.

| | 2017.12.31 | 2017.01.01 |
|---|---|---|
| මුළු වත්කම් | 600 000 | ? |
| මුළු වගකීම් | 420 000 | 380 000 |

2017.12.31 දිනෙන් අවසන් වර්ශය සඳහා ව්‍යාපාරය විසින් උපයන ලද ශුද්ධ ලාභය රු. 215 000 ක් වන අතර කලච්ඡේදය තුළ අයිතිකරු විසින් රු. 60 000 ක් යොදාවා ඇති අතර රු. 15 000 ක් ගැණිලි කර ඇත.

2017.01.01 දිනට පැවති වත්කම්හි නිවැරදි වටිනාකම ගණනය කරන්න.

I. රු. 625 000 කි.
II. රු. 690 000 කි.
III. රු. 300 000 කි.
IV. රු. 830 000 කි.
V. රු. 500 000 කි.

18. සුවීගේ ව්‍යාපාරයේ පහත ගනුදෙනු 2017 දෙසැම්බර් මාසයට අදාලව සිදුවිය.

ශුද්ධ ලාභය කෙරෙහි බලපාන ගනුදෙනු වන්නේ,

I. වත්කම් හා වගකීම්
II. ආරම්භක හිමිකම් හා අවසාන හිමිකම්
III. ගැණිලි හා අමතර ප්‍රාග්ධනය
IV. ආදායම් හා වියදම්
V. මුදල් ප්‍රවාහයන්

19. අයිතකරු විසින් පිරිවැය රු. 800 000 ක් වූ රථවාහනයක් 2016.10.01 දින ව්‍යාපාරයට යොදවන ලදි. මෙම රථ වර්ශ 10 ක කාලයක් භාවිතා කිරීමට අපේක්‍ෂා කරයි. ආයතනයේ ගිණුම් වර්ශය 2017.03.31 දිනෙන් අවසන් වේ. ඉහත ගනු දෙනුව ගිණුම්කරණ සමීකරණයට ඇතිකරන ලද ශුද්ධ බලපෑම වන්නේ,

| | වත්කම් | = | හිමිකම් | + වගකීම් |
|---|---|---|---|---|
| I. | + 760 000 | = | + 760 000 | - |
| II. | + 720 000 | = | + 720 000 | - |
| III. | + 800 000 | = | + 720 000 | + 80 000 |
| IV. | - 800 000 | = | - 800 000 | - |
| V. | + 880 000 | = | + 880 000 | |

20. ණය ගැතියෙකුගෙන් 10% වට්ටමක් අඩුකල පසු ලද මුදල රු. 1 080 000 කි. එමෙන්ම ණයහිමියන්ට මුදල් ගෙවීමේ දී 10% ක වට්ටමක් ලෙස රු. 80 000 ක් ලැබීම. මෙම ගනුදෙනු මූලික ගිණුම්කරණ සමීකරණයක් මගින් දැක්වුවහොත් වඩාත් නිවැරදි වන්නේ,

| | වත්කම් | = | හිමිකම් | + වගකීම් |
|---|---|---|---|---|
| I. | - 108 000 | = | - 108 000 | - |
| II. | - 120 000 | = | - 120 000 | - |
| III. | - 840 000 | = | - 40 000 | - 800 000 |
| IV. | - 828 000 | = | - 28 000 | - 800 000 |
| V. | - 120 000 | = | - 40 000 | - 80 000 |

21. ආයතනය විසින් පිරිවැය රු. 100 000 ක් වූ භාණ්ඩ 10% ලාභාන්තිකයක් සහිතව අලෙවි කරනු ලබයි. මෙම භාණ්ඩ තොගය පුණ්‍ය ආයතනයකට පරිත්‍යාග කරන ලදි. මෙම ගනුදෙනුව මූලික ගිණුම්කරණ සමීකරණය මගින් දැකවුවහොත්,

| | වත්කම් | = | හිමිකම් | + වගකීම් |
|---|---|---|---|---|
| I. | - 110 000 | = | - 110 000 | - |
| II. | - 100 000 | = | - 100 000 | - |
| III. | - 10 000 | = | - 10 000 | - |
| IV. | - 90 000 | = | - 90 000 | - |
| V. | ඉහත කිසිවක් නොවේ | | | |

22. ආයතනය විසින් ගෙවිය යුතු ණය වාරිකය රු. 120 000 ක් වූ අතර ඒ තුළ අඩංගු පොළිය රු. 20 000 කි. මෙම වටිනාකම අයිතිකරු විසින් සිය පුද්ගලික මුදලින් ගෙවා දැමීය. ගනුදෙනුවේ බලපෑම,

| | | | |
|---|---|---|---|
| I. | වත්කම් අඩුවේ 120 000, | වගකීම් අඩුවේ 80 000, | හිමිකම් අඩුවේ 40 000 |
| II. | වත්කම් නොවෙනස්, | වගකීම් අඩුවේ 80 000, | හිමිකම් අඩුවේ 80 000 |
| III. | වත්කම් නොවෙනස්, | වගකීම් අඩුවේ 100 000, | හිමිකම් වැඩිවේ 100 000 |
| IV. | වත්කම් අඩුවේ 120 000, | වගකීම් අඩුවේ 40 000, | හිමිකම් අඩුවේ 80 000 |
| V. | වත්කම් අඩුවේ 120 000, | වගකීම් අඩුවේ 120 000, | හිමිකම් නොවෙනස්වේ |

23. 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 75 000 ක අලාභයක් ලැබූ ව්‍යාපාරයකට ආළව පහත සඳහන් තොරතුරු සපයා ඇත. මෙම ව්‍යාපාරය 2013.04.01 දින ආරම්භ කරන ලදි.

| | රු. .000 |
|---|---|
| වර්ෂය තුළ මුළු වගකීම්වල වැඩිවීම | 900 |
| ගැනිලි | 50 |
| අතිරේක ප්‍රාග්ධනය යෙදවීම | 225 |

2014.03.31 දිනෙන් අවසන් වර්ෂයේ වත්කම්වල වැඩිවීම හෝ අඩුවීම කොපමණ ද ?

I. රු. 825 000 ක වැඩිවීම කි.
II. රු. 975 000 ක අඩුවීම කි.
III. රු. 975 000 ක වැඩිවීම කි.
IV. රු. 1 000 000 ක වැඩිවීම කි.
V. රු. 1 150 000 ක වැඩිවීම කි.

24. පහත සඳහන් කුමන ප්‍රකාශය මගින් "වත්කමක්" යන්නෙහි අර්ථය වඩාත් හොඳින් විස්තරය කරනු ලබයි ද?

I. වර්ෂ දෙකක කාලයක් සඳහා බැංකුවක තැන්පත් කර ඇති ස්ථාවර තැන්පතුවක්
II. මූල්‍ය ප්‍රකාශවල පිරිවැය මත අගය කරනු ලැබූ භෞතික පැවැත්මක් ඇති අයිතමයක්
III. අනාගත ආර්ථික ප්‍රතිලාභ සහිත ව්‍යාපාරයට අයිති වූ ආර්ථික සම්පතක්
IV. අනාගතයේ දී මුදල් ලබා ගැනීමේ අයිතියක් ඇති ආර්ථික සම්පතක්
V. ව්‍යාපාර විසින් පාලනය කරනු ලබන අනාගත ප්‍රතිලාභ අපේක්ෂා කරන ආර්ථික සම්පතක්

25. 1995 අංක 15 දරන ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනතට අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පිළියෙල කරනු ලබන්නේ,

I. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව මගිනි.
II. අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත මණ්ඩලය මගිනි.
III. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මගිනි.
IV. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත කමිටුව මගිනි.
V. ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩලය මගිනි.

26. තනි ව්‍යාපාරයක අයිතිකරුගේ හිමිකමට බලපෑමක් ඇති නොකරන්නේ පහත සඳහන් ගනුදෙනු අතුරෙන් කුමන ගනුදෙනුව ද?

I. අයිතිකරු විසින් ආයෝජනය කිරීම.
II. අයිතිකරු විසින් මුදල් ආපසු ගැනීම.
III. විකුණුම් සඳහා මුදල් ලැබීම.
IV. නොඉපයූ ආදායම් සඳහා මුදල් ලැබීම.
V. වියදම් සඳහා මුදල් ගෙවීම.

27. ගිණුම්කරණ සංකල්පනාත්මක රාමුවට අනුව යම් වගකීමක් සඳහා අත්‍යවශ්‍ය වන ලක්ෂණ මොණවා ද ?.

I. නෛතිකව එකගතාවයක් තිබීම.
II. වටිනාකම විශ්වාසදායී ලෙස මැණිය හැකිවීම.
III. ආර්ථික ප්‍රතිලාභ අනාගතයේ දී ගලා ඒමේ හැකියාව.
IV. වර්ථමානයේ පවතින බැඳීම.
V. අයිතිකරු විසින් වගකීම පියවිය යුතුවිම.

28. ණයට මිලදී ගන්නා ලදි. මසක් ඇතුළත පියවන වටිනාකම මත 10% ක මුදල් වට්ටමක් ලබාදෙන බව ණයහිමියා දැනුම් දී ඇත. 2017.03.31 දින වන විට මුදලින් රු. 90,000 ක් ගෙවා ඇත්නම් 2017.03.31 දිනට වගකීම වන්නේ,

I. රු. 80,000 කි.
II. රු. 90,000 කි
III. රු. 100,000 කි.
IV. රු. 120,000 කි.
V. රු. 180,000 කි.

29. ව්‍යාපාරයක ලාභය ගණනය කිරීම සඳහා යොදා ගත හැකි සමීකරණ වන්නේ,

I. ආරම්භක ශුද්ධ වත්කම් – අවසාන ශුද්ධ වත්කම් - ගැනිලි + අතිරේක ප්‍රාග්ධනය
II. ආරම්භක ශුද්ධ වත්කම් – අවසාන ශුද්ධ වත්කම් + ගැනිලි – අතිරේක ප්‍රාග්ධනය
III. අවසාන ශුද්ධ වත්කම් – ආරම්භක ශුද්ධ වත්කම් + ගැනිලි – අතිරේක ප්‍රාග්ධනය
IV. අවසාන ශුද්ධ වත්කම් – ආරම්භක ශුද්ධ වත්කම් + ගැනිලි + අතිරේක ප්‍රාග්ධනය
V. අවසාන ශුද්ධ වත්කම් + ආරම්භක ශුද්ධ වත්කම් - ගැනිලි – අතිරේක ප්‍රාග්ධනය

30. සමාගමක් විසින් ලබාගත් ණය සඳහා උපචිත වූ පොලිය ගිණුම්ගත කිරීම මගින්,

**I.** හිමිකම අඩුවන අතර වත්කම් වැඩි වේ.
**II.** හිමිකම හා වත්කම් යන දෙකම වැඩි වේ.
**III.** හිමිකම අඩුවන අතර වගකීම් වැඩි වේ.
**IV.** හිමිකම හා වගකීම් යන දෙක ම වැඩි වේ.
**V.** හිමිකම වැඩිවන අතර වගකීම් අඩු වේ.

31. පහත එක් එක් ද ගිණුම්කරණ මූලිකාංග යටතේ වර්ගීකරණය කරන්න.

A. ආපසු එවුම් -: ...........................................
B. ආපසු යැවුම් -: ...........................................
C. ගැණිලි -: ...........................................
D. බොල්ණය -: ...........................................

32. ආයතනයක කළමණාකරන මූල්‍ය ප්‍රකාශන සහ පොදු මූල්‍ය ප්‍රකාශන (මූල්‍ය ගිණුම්කරණ) අතර පවත්නා වෙනස්කම් පහත පදනම් යටතේ දක්වන්න.

| | විස්තරය | කළමණාකරණ ගිණුම්කරණය | මූල්‍ය (පොදු) ගිණුම්කරණය |
|---|---|---|---|
| I. | මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ පරමාර්ථය | ............................................ | ............................................ |
| II. | වර්ශයකට මූල්‍ය වාර්ථා පිළියෙ කරන වාර ගණන | ............................................ | ............................................ |
| III. | භාවිතා කරන තොරතුරු වල ස්වාභවය. | ............................................ | ............................................ |
| IV. | මූල්‍ය වාර්තා භාවිතා කරන පාර්ශවය | ............................................ | ............................................ |

33. පහත දෑ සත්‍යවේ ද, අසත්‍ය වේද යන්න ඉදිරියෙන් දක්වන්න.

A. ගිණුම්කරණ ඒකක සංකල්පය තනි ව්‍යාපාර සඳහා පමණක් අදාල වේ ..........................

B. ගිණුම්කරණ මගින් ව්‍යාපාරයට අභ්‍යන්තර පාලනයක් ඇති කරයි ..........................

C. ආයතනයේ සෑම තොරතුරක්ම නොසගවා ඉදිරිපත් කිරීම ගිණුම්කරණය මගින් සිදු වේ ..........................

D. සේවක දක්ෂතා මූල්‍ය මිණුම් සංකල්පයට අනුව මූල්‍ය ප්‍රකාෂණ තුළ ඇතුලත් නොකරයි ..........................

34. පහත තොරතුරු යොදාගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න. (ඉංග්‍රීසි අක්ෂරය ලිවීම ප්‍රමාණවත් වේ)

A. ණයගැති
B. ගිණුම්කරණ නිමවුමකි
C. මූලික උපකල්පනයකි
D. මූලික ගුණාත්මක ලක්ෂණය
E. ආදායම් හා වියදම්

I. ශුද්ධ ලාභය ගණනය කිරීම සඳහා ආදායම් ප්‍රකාශයට ශේෂය කාලච්ජේදය අවසානයේ දී මාරු කරයි ..................

II. අදාල බව හා විශ්වාසනීයත්වය ..................

III. ව්‍යාපාරයට වත්කමකි ..................

IV. ගිණුම්කරණ සටහන් හා හෙළිදරවු කිරීම් ..................

35. පහත ගිණුම්කරණ නිමවුම් මූල්‍ය ගිණුම්කරණයට අදාලවේ ද, කළමණාකරණ ගිණුම්කරණයට අදාල වේ ද යන්න දක්වන්න. (ඉංග්‍රීසි අක්ෂරය ලිවීම ප්‍රමාණවත් වේ)

A. අධ්‍යක්ෂක වාර්තා

B. පිරිවැය විශ්ලේෂණ ප්‍රකාෂණ

C. මූල්‍ය තත්ව ප්‍රකාශය

D. ආදායම් ප්‍රකාශය

E. ලාභ හෝ අලාභ නොමැති නිමැවුම

F. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| මූල්‍ය ගිණුම්කරණය | කළමණාකරන ගිණුම්කරණය |
|---|---|
| | |

36. VAT සඳහා ලියාපදිංචි වු ආයතනයක පහත තොරතුරු උපුටා ගන්නා ලදි.

ආයතනය විසින් පිරිවැය රු. 500 000 ක් වටිනා භාණ්ඩයක් 10% VAT බදු සහිතව ණයට මිලදී ගන්නා ලදි. අනතුරුව ආයතනය විසින් මිලදීගත් අමුද්‍රව්‍ය වෙනුවෙන් වැය කරන ලද සේවක වේතනය රු. 200 000 ක් වූ අතර විදුලි වියදම හා අළුත්වැඩියා වියදම රු. 100 000 කි. අනතුරුව මිලදීගත් අමුද්‍රව්‍ය පිරිවැයට 25% ක ලාභාංශයක් සහ 10% VAT එකතුකර ණයට විකුණන ලදි.

මෙම ගනුදෙනුව මූලික ගිණුම්කරණ සමීකරණයට ගලපන්න.

| වත්කම් = | වගකීම් + | හිමිකම් |
|---|---|---|
| ............................................<br>............................................<br>............................................ | ............................................<br>............................................<br>............................................ | ............................................<br>............................................<br>............................................ |

37. 10% සේවකයා සහ 15% ක් සේවා ආයතනය විසින් EPF ගෙවිය යුතු ආයතනයකට අදාලව පහත තොරතුරු වැටුප් ලේඛණයෙන් උපුටා ගන්නා ලදි. EPF වැටුප මත 3% කි.

10% EPF සේවකයාගෙන් අඩුකල පසු සේවකයාට ගෙවූ ශුද්ධ වැටුප රු. 540 000 කි.

මෙම ගනුදෙනුව මූලික ගිණුම්කරණ සමීකරණය මගින් දක්වන්න. ( EPF හා ETF මෙතෙක් නොගෙවා ඇතැයි උපකල්පනය කරන්න)

| වත්කම් = | වගකීම් + | හිමිකම් |
|---|---|---|
| | | |

38. ව්‍යාපාරයක පහත ගනුදෙනු මොටර් රථ අලෙවි කරන දයාන්ගේ ව්‍යාපාරයේ 2017.12.31 දිනෙන් අවසන් වර්ශයට අදාලව සිදුවිය.

A. එකක පිරිවැය රු. 4 000 000 මොටර් රථ 12 ක් සමන් ව්‍යාපාර ආයතනයෙන් මිලදී ගැණීම. මින් රථ 2 ක් කපිලගේ ව්‍යාපාරයේ භාවිතය සඳහා වේ.
B. පිරිවැය මත 25% ක ලාභාන්තිකයක් එකතු කර මිල ලකුණු කල අතර ලකුණු කල මිල මත 10% ක වෙළද වට්ටමක් ලබා දී ඇත.
C. ආයතනය විසින් අලෙවි කරන ලද මෝටර් රථ සංඛ්‍යාව 6 කි.

ඉහත ගනුදෙනු මූලික ගිණුම්කරණ සමීකරණය භාවිතයෙන් දක්වන්න.

..............................................................................................................................................................
..............................................................................................................................................................
..............................................................................................................................................................

39. ආයතනය විසින් ගෙවා ඇති වියදම්වල සාරාංශය පහත පරිදි වේ.

2017 වර්ශයේ දී මුදලින් ගෙවු වියදම්

- 2016 සඳහා 80 000
- 2017 සඳහා 120 000
- 2018 සඳහා 10 000

ප්‍රවර්ථන වර්ශය 2017 යැයි උපකල්පනය කර ඉහත ගනුදෙනු ගණුම්කරණ සමීකරය යටතේ දක්වන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

40. ව්‍යාපාරයක් විසින් ණය හිමියකු හදුනා ගැණීම සදහා අත්‍යවශ්‍ය කොන්දේසි දෙකක් දක්වන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

41. පහත ප්‍රකාශනවල සත්‍ය අසත්‍යබව දක්වන්න.

A. සෑම ආයතනයක්ම ගිණුම්කරණය කිරීම නීතිමය අවශ්‍යතාවයකි ..........................

B. මූලික පොතක ගනුදෙනු ද්විත්ව සටහන භාවිතයෙන් සටහන් කරයි ..........................

C. මූලික පොත් වල සිදුවන වැරදි ශේෂ පිරික්සුමට බලපෑම් ඇති නොකරයි ..........................

D. සෑම ගනුදෙනුවක් සදහාම මූලික පොතක් අවශ්‍ය නොවේ ..........................

42. පහත වගුවෙහි සුදුසු මූලික පොත, මූලාශ්‍ර ලේඛණය හෝ ගනුදෙනුව නිවරදිව යොදාගනිමින් හිස්තැන් පුරවන්න.

| | මූලික පොත | මුලාශ්‍ර ලේඛණය | ගනුදෙනුව |
|---|---|---|---|
| A. | ආපසු යැවුම් ජර්නලය | .......................... | ........................................ |
| B. | .................................. | .......................... | චෙක් පතකින් ගෙවීම |
| C. | .................................. | විකුණුම් ඉන්වොයිසිය | ........................................ |
| D. | සුළු මුදල් ජර්නලය | .......................... | ........................................ |

පහත තොරතුරු භාවිතා කරමින් ප්‍රශ්න අංක 43 සහ 44 සදහා පිළිතුරු සපයන්න.

සුමුදු ව්‍යාපාරය කිරිබත්ගොඩ ප්‍රදේශයේ ප්‍රසිද්ධ ආයතනයකි. ආයතනයේ පහත තොරතුරු 2017 සහ 2016 ගිණුම් වර්ශයන් සදහා අදාල වේ. සෑම ගිණුම් වර්ශයක්ම මාර්තු 31 දිනෙන් අවසන් වේ.ආයතනයේ තොරතුරු කිහිපයක් පහත දැක් වේ.

| | 2017.03.31 | 2016.04.01 |
|---|---|---|
| වත්කම් | 1 250 000 | 750 000 |
| වගකීම් | 425 000 | 310 000 |

2017.03.31 දිනෙන් අවසන් ගිණුම් වර්ශය තුළ අයිතිකරු විසින් සිදුකර ඇති භාණ්ඩ ගැණිලි රු. 25 000 ක් වූ අතර අයිතිකරු විසින් රැගෙනගිය මුදල රු. 15 000 කි. තව ද,

පහත ගනුදෙනු ගිණුම් තැබිමේ දී මගහැරී ඇති.

A. අයිතිකරු විසින් රු. 100 000 ක ව්‍යාපාරයේ පරිපාලන වියදමක් පුද්ගලික මුදලින් ගෙවා ඇත.

B. රු. 60 000 ක කල්බදු වාරිකයක් ගෙවිම. වාරිකය තුළ අඩංගු පොළිය රු. 10 000 කි.

43. ඉහත A සහ B යන ගණුදෙනු මගින් ගිණුම්කරණ සමීකරණයට ඇතිකරන බලපෑම දක්වන්න.

වත්කම් = වගකීම් + ප්‍රාග්ධනය

.................................................................................................................................................................

.................................................................................................................................................................

44. ඉහත A සහ B යන ගණුදෙනු ද සැලකිල්ලට ගත් පසු ව්‍යාපාරය විසින් 2017.03.31 දිනෙන් අවසන් වර්ශය සඳහා උපයන ලද ශුද්ධ ලාභය ගණනය කරන්න

.................................................................................................................................................................

.................................................................................................................................................................

පහත තොරතුරු යොදාගනිමින් ප්‍රශ්න අංක 45 සිට 47 දක්වා පිළිතුරු සපයන්න.

**මුදල් ලැබීම් ජර්නලය**

| දිනය | විස්තරය | දුන්වට්ටම් | වටිනාකම | විශ්ලේෂණ තීරු | | |
|---|---|---|---|---|---|---|
| | | | | ණයගැති ලැබීම් | අත්පිට විකුණුම් | ආදායම් |
| 1-Jun | සුනීතා | 6,000 | 64,000 | 64,000 | - | - |
| 5-Jan | විනීතා | 9,000 | 81,000 | 81,000 | - | - |
| 20-Jan | නදීෂා | 11,000 | 99,000 | 99,000 | - | - |
| 27-Jan | උමාෂා | - | 40,000 | 40,000 | - | - |
| | | **26,000** | **284,000** | **284,000** | **-** | **-** |

**ආපසු එවුම් ජර්නලය**

| ධිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|
| 12-Jan | සුනීතා | 5,000 |
| 17-Jan | විනීතා | 70,000 |
| 22-Jan | නදීෂා | 15,000 |
| 31-Jan | | **90,000** |

**විකුණුම් ජර්නලය**

| දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|
| 1-Jan | සුනීතා | 300,000 |
| 3-Jan | විනීතා | 500,000 |
| 15-Jan | නදීෂා | 1,700,000 |
| 25-Jan | උමාෂා | 270,000 |
| 31-Jan | | **2,770,000** |

45. විකුණුම් ජර්නලයේ එකතුව සහ ණයගැති ලැබීම් තීරුවේ එකතුව දැක්වීමට අදාල ද්විත්ව සටහන් දක්වන්න.

.................................................................................................................................................................

.................................................................................................................................................................

46. ආයතනයේ ශුද්ධ විකුණුම් ගණනය කරන්න.

.................................................................................................................................................................

.................................................................................................................................................................

47. 2017.01.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයේ වත්කමක් ලෙස හදුනා ගන්නා ණයගැති ශේෂය ගණනය කරන්න.

.................................................................................................................................................................

.................................................................................................................................................................

48. එක්තරා ගනුදෙනුවක් ගිණුම්කරණ සමීකරණයට ඇතිකරන බලපෑම පහත පරිදි දක්වා ඇත. එම ගනුදෙනුව විස්තර කරන්න.

| වත්කම් | = | වගකීම් | + | හිමිකම් |
|---|---|---|---|---|
| - 150 000 | | - 120 000 | | - 30 0000 |

................................................................................................................................................

................................................................................................................................................

49. ආයතනය විසින් යන්ත්‍ර අළුත්වැඩියා වෙනුවෙන් දරන ලද රු. 60 000 ක් යන්ත්‍ර ගිණුමේ සටහන් කර ඇත. මෙම වරද නිවැරදි කිරිම ගිණුම්කරයට ගැලපීම් කරන්න.

................................................................................................................................................

................................................................................................................................................

50. ණයහිමියන්ට ගෙවිය යුතු රු. 600 000 ක මුදලක් අයිතිකරු විසින් පියවීමේ දී 10% ක වට්ටමක් ලැබුණි. මෙම ගනුදෙනුව නිසා අයිතිකරුගේ හිමිකමට ඇතිකන බලපෑම ගණනය කරන්න.

................................................................................................................................................

................................................................................................................................................

කණ්ඩායම් පංති සඳහා - 071 2616609